# කාර්යසාධන වාර්තාව 2018

# (2018.01.01 – 2018.12.31)

## නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

අංක 80, 4 වන මහළ, අධිකරණ මාවත, කොළඹ 12

www.lawcom.gov.lk

## 1. හැඳින්වීම

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

## 2. දැක්ම

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

## 3. මෙහෙවර

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

## 4. අරමුණු සහ කාර්යයන්

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතිය ද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

**නීති කොමිෂන් සභාවේ නව සමාජිකයන් ලෙස පහත නම් දක්වා ඇති අය පත් කරන ලදී.**

1. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා (සභාපති)
2. මහාචාර්ය ලක්ෂ්මන් මාරසිංහ මහතා
3. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා
4. ජේ. එම්. ස්වාමිනාදන් මහතා
5. එන්. සෙල්වකුමාරන් මහතා
6. ජනාධිපති නීතිඥ එම්. ඉක්‍රම් මොහොමඩ් මහතා
7. ජනාධිපති නීතිඥ එස්. අනිල් සිල්වා මහතා
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
9. ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහතා
10. ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා
11. ධාරණී එස්. විජේතිලක මිය
12. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය
13. ජී. ජී. අරුල්ප්‍රගාසම් මහතා
14. තිසත් විජේගුණවර්ධන මහතා
15. නවින් මාරපන මහතා.

**නිලබලයෙන් පත් වූ සාමාජිකයන්:**

I. දීපානි කුමාරජීව මිය, නීති කෙටුම්පත් සම්පාදක / නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.

II. පියුමන්ති පීරිස් මිය, අතිරේක ලේකම් (නීති) / අධිකරණ අමාත්‍යාංශය.

III. ජනාධිපති නීතිඥ සංජය රාජරත්නම් මහතා, අතිරේක සොලිසිටර් ජෙනරාල්/ නීතිපති දෙපාර්තමේන්තුව.

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය:**

- සෙව්වන්දි අබේසේකර මිය, ලේකම් (වැ.බ.) / නීති කොමිෂන් සභාව.
- ලිලන්ති පතිනාගොඩ මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.
- යසාංජි චතුරංගිකා මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.

## 5. 2018.01.01 සිට 2018.12.31 දින දක්වා නීති කොමිෂන් සභාවේ නිර්දේශිතයන්ගේ කාර්යසාධනය

**කාලසීමාව :- 2018.01.01 – 2018.09.30**

1.) අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය

| | |
|---|---|
| **නිර්දේශිතය** | අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය. |
| **පසුබිම** | යෝජනා කරන ලද පනතේ ප්‍රධානම කාර්යය වන්නේ, අපහාස කිරීම පිළිබඳ වන්නා වූ නීතිය සංග්‍රහ ගත කිරීම සහ එහි විෂය පථය පැහැදිළි කිරීම වේ. |
| **වත්මන් තත්ත්වය** | සාකච්ඡා වෙමින් පවතියි.<br>ආචාර්ය ජේ.එම්.ස්වාමිනාදන් මහතා විසින් සකස් කරන ලද අධිකරණයට අපහාස කිරීම පිළිබඳ වන්නා වූ කෙටුම්පත සභාගත කර සාකච්ඡා කරන ලදී. |

2.) නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය

| | |
|---|---|
| **නිර්දේශිතය** | නඩු භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය. |
| **පසුබිම** | අධිකරණයේ නඩු විභාගය සඳහා මූලික සාක්ෂ්‍යය වශයෙන් නඩු භාණ්ඩ ඉදිරිපත් කළ යුතු බැවින් - ආයුධ, ඇඳුම් සහ නීති විරෝධී මත්පැන් බෝතල් හා මත් ද්‍රව්‍ය වැනි වැදගත් නඩු භාණ්ඩයන් අධිකරණ භාණ්ඩ භාරකරුගේ භාරයේ තබනු ලබයි. නඩු විභාගය අවසානයේදී නිකුත් කරනු ලබන උසාවි නියෝගයක් මත පමණක් ඒවා බැහැර කළ හැකි වේ. |
| **වත්මන් තත්ත්වය** | සාකච්ඡා වෙමින් පවතියි.<br>ජනාධිපති නීතීඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද නඩු භාණ්ඩ බැහැර කිරීම - වර්ග කිරීම සම්බන්ධයෙන් වූ සංශෝධිත කෙටුම්පත සභාගත කර සාකච්ඡා අවසාන කරන ලදී. |

3.) දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා සම්බන්ධයෙන් වන නීතිය

| | |
|---|---|
| නිර්දේශිතය | දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා සම්බන්ධයෙන් දැනට පවතින නීතිය සඳහා සංශෝධනය. |
| පසුබිම | පිළිසකර කරගත නොහැකි විවාහ බිඳවැටීම් සම්බන්ධයෙන් වන්නාවූ දික්කසාදය, දික්කසාද දීමනා සහ භාරකාරත්වය පිළිබඳව දැනට පවතින නීති සහ ආඥා පනත්, එම කරුණු පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස ක්‍රමානුකූලව සකසා, එම නීති සහ ආඥා පනත් සියල්ලම එකට එකතුකර එක් ආඥා පනතක් ලෙස සංග්‍රහගත කිරීම.<br>• පොදු එකඟතාවක් ඇති අවස්ථාවක්.<br>• එක් පාර්ශවයකට දික්කසාදය අවශ්‍ය නොවන්නාවූ බැවින් අන්‍යෝන්‍ය එකඟතාවයක් නොමැති අවස්ථාවක්.<br>භාරකාරත්වය : දරුවාගේ යහපත වෙනුවෙන්.<br>දික්කසාද දීමනා : සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය.<br>නඩත්තු : අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට නොව දිස්ත්‍රික් අධිකරණයකට පැවරිය යුතු අතර ඊට ඌනපූරකව එකතුකළ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කිරීම සහ දඩුවම් පිණිස වන බලය දිස්ත්‍රික් අධිකරණය වෙත පැවරිය යුතුය. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි.<br>1). ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද කෙටුම්පත සාකච්ඡා කරන ලදී. කොමිෂන් සභාව විසින් දික්කසාදය සඳහා පහත දැක්වෙන හේතු සම්බන්ධයෙන් සංශෝධන කීපයක් යෝජනා කරන ලදී.<br>• ද්වේශ සහගත ලෙස අතහැර යාම.<br>• අනාචාරය.<br>• විවාහ වන අවස්ථාවේදී පවතින සුවකළ නොහැකි ලිංගික දුබලතාව.<br>• කුරිරුතාව.<br>• ශාරීරික හා මානසික හිරිහැර කිරීම.<br>• වෙන්වීම (වසර 2).<br>2). 2018.03.22 දිනැති හා MOJ/L/(1) 360/2018 අංක දරන ලිපිය මගින් අධිකරණ අමාත්‍යාංශය විසින් ඉහත සංශෝධන පිළිබඳ පැහැදිලි කිරීම් කීපයක් විමසන ලදී.<br><br>3). ඉහත කරුණු සම්බන්ධයෙන් අවසාන කරන ලද කෙටුම්පත, සභාපතිගේ උපදෙස් මත අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) පියුමන්ති පීරිස් මිය වෙත 2018.09.13 දිනැති හා LC/R/03/2018 අංක දරන ලිපිය මගින් ඉදිරි කටයුතු සඳහා යොමු කරන ලදී. |

## 4.) බාලවයස්කරුවන් මිය යාම මත අලාභහානි අයකර ගැනීම

| | |
|---|---|
| **නිර්දේශිතය** | බාලවයස්කරුවන් මිය යාම මත අලාභහානි අයකර ගැනීම. |
| **පසුබිම** | රෝම ලංදේසි නීතිය යටතේ, නොසැලකිල්ල හෝ හදිසි අනතුරක් හේතුවෙන් බාලවයස්කාර දරුවකුගේ මරණය සිදුවූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් එකී දරුවාගේ මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා නඩුකරයක් පැවරීමෙන් අලාභහානි අයකර ගැනීමට එකී මාපියන්ට නොහැකි වීම රෝම ලන්දේසි නීතියේ ස්ථාවරය බවට පත්වී ඇත.<br><br>යථෝක්ත ස්ථාවරය වර්තමානයේ දී යුක්තියේ මූලධර්මයන්ට ප්‍රත්‍යක්ෂවම අනුකූල නොවේ. යම් තෙවන පාර්ශ්වයක නොසැලකිල්ල හෝ අපරික්ෂාකාරීත්වය නිසා බාලවයස්කාර දරුවකුගේ මරණය සිදුවූ විටක, එහි ප්‍රතිඵලයක් වශයෙන් මාපියන්ට ඇතිවන මානසික වේදනාව සහ චිත්ත පීඩාව සඳහා අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකියාවක් තිබිය යුතුය.<br>යම් තෙවන පාර්ශ්වයක නොසැලකිල්ල හෝ අපරික්ෂාකාරීත්වය බාලවයස්කාර දරුවකුගේ මරණයට හේතුව වන විටක, එකී දරුවාගේ මාපියන්ට ඇතිවන මානසික වේදනාව සඳහා මෙන්ම එකී දරුවාගේ අනාගත ඉපයුම් අහිමි වීම වෙනුවෙන් ද අලාභහානි අයකර ගැනීමට එකී දරුවාගේ මාපියන්ට හැකි විය යුතු බව සහතික කිරීම පිණිස පනතක් හඳුන්වා දීම සඳහා වන්නා වූ සංශෝධනය. |
| **වත්මන් තත්ත්වය** | 2018.06.29 වන දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් යැපෙන්නෙකු මිය යාම මත අලාභ-හානි අයකර ගැනීම පිළිබඳ වන අවසාන කරන ලද පනත් කෙටුම්පත ත්‍රෛ භාෂා මාධ්‍යයන්ගෙන් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

5.) කේවියට්

| නිර්දේශිතය | කේවියට්. |
|---|---|
| පසුබිම | මුදල් නෝට්ටුවක හෝ කාසියක අයිතිකරු තහවුරු කර ගැනීම කිසිසේත්ම කළ හැකි නොවේ. එමෙන්ම සුපරික්ෂාකාරීත්වයේ නිශ්චිත පරීක්ෂණයක් නොකර මුදල් මුදා හැරීම ද අභිමත නොවේ. යම් නිශ්චිත තැනැත්තකුගේ සන්තකයේ තිබී මුදල් ගැනීමක් හෝ මුදල් සොරකම් කිරීමක් පිළිබඳව පැහැදිලි සාක්ෂියක් බැලූ බැල්මට පෙනෙන්නට තිබෙන අවස්ථාවකදී නම්, එම මුදල් එම තැනැත්තාට ම ලබාදීමක් කළ හැකිය. එහෙත්,එසේ කළ හැකි වන්නේ, යම් ලෙසකින් නඩු විභාගයේදී එම මුදල්වල අයිතිය වෙනත් තැනැත්තකුගේ බවට පෙනී ගියහොත් එම මුදල් නැවත ලබාදෙන බවට අදාළ බැඳුම්කර අත්සන් කර අධිකරණය විසින් සුදුසු බවට විනිශ්චයකොට පනවනු ලබන කොන්දේසිවලට ද යටත්වීමෙන් අනතුරුවය. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි.<br>ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සම්බන්ධයෙන් වන විටදී කේවියට් සඳහා අදාළ වන නීතිය පහත පරිදි සංශෝධනය විය යුතු බවට කොමිෂන් සභාවේ අදහස විය.<br>• කේවියටය ගොණු කළ යුත්තේ නීතිඥවරයකුගේ සහතිකයක් සමග වන අතර එම නීතිඥවරයා විසින් එය නිර්ව්‍යාජ බවට සෑහීමකට පත් විය යුතුය.<br>• නීතිඥවරයා විසින් නොසැලකිලිමත් බවින් එවැනි සහතිකයක් ඉදිරිපත් කරන ලද්දේ නම්,ඔහු විසින් පෞද්ගලිකව ඊට අලාභ-හානි ගෙවිය යුතු වන්නේය.<br>• රාජකාරියේ නොසැලකිලිමත් බව පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කළ හැකිය.<br>1923 අංක 23 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ කේවියට් සම්බන්ධයෙන් වන 32 වගන්තිය යටතේ ජී.ජී. අරුල්ප්‍රගාසම් මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාවේ කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. |

## 6.) ලිංගික අල්ලස් පනත සඳහා වන සංශෝධන

| | |
|---|---|
| නිර්දේශිතය | අල්ලස් පනතට ලිංගික අල්ලස් දීමේ / ගැනීමේ වැරදි ඇතුළත් කිරීම. |
| පසුබිම | බලතල සහිත හෝ අධිකාරී තත්ත්වයේ සිටින ඕනෑම තැනැත්තකු විසින් මෙම අධිකාරීත්වය ක්‍රියාවට නැංවීමේදී: රැකියාවක් ලබාදීමට, උසස්වීමක් ලබාදීමට, හිමිකමක් ලබාදීමට, වරප්‍රසාදයක් ලබාදීමට හෝ වෙනත් යම් සේවාවක් ලබාදීමට කවරාකාරයක හෝ කැමැත්තක් හෝ වෙනත් යම් ඕනෑම ආකාරයක වාසියක් ලබාදීම සඳහා කොන්දේසියක් වශයෙන් ලිංගික කැමැත්ත ඉල්ලීම හෝ භාරගැනීම කරනු ලබයි නම්; මෙම පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතරම රු. (මුදල ඇතුළත් කරන්න.) ට නොවැඩි දඩයකට හෝ අවුරුදු 3 කට නොවැඩි කාලයක් දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටමටම යටත් විය යුතුය.<br>...... යන අංක දරන ඉහත වගන්තියේ කාර්යය සඳහා "ලිංගික කැමැත්ත" යන්නෙන් -<br>(අ.) ලිංගික සංවාස,<br>හෝ<br>(ආ.) ලිංගික සංවාසයක් ලෙස සලකනු නොලබන, නමුත් ලිංගික ස්වභාවයේ කායික, වාචික හෝ වාචික නොවන්නාවූ හෝ සංස්ථාපනය කරනු ලබන්නාවූ වෙනත් ඕනෑම ක්‍රියාවක්,<br>අදහස් වන්නේය. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි.<br><br>ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාව සභාගත කර සාකච්ඡා කරන ලදී. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය විසින් යෝජිත සංශෝධනය, ලිංගික හිරිහැර කිරීම සම්බන්ධයෙන් වන නීතිය සමග අතිච්ඡාදනය වන්නේද යන්න පිළිබඳ අදහස් දක්වන ලදී.<br><br>ඉහත මාතෘකාව අධ්‍යනය කිරීම සඳහා පහත සාමාජිකයන් අනුකමිටුවට පත්කරන ලදී.<br>ආචාර්ය ජේ. එම්. ස්වාමිනාදන් මහතා.<br>සංජය රාජරත්නම් මහතා. |

## 7.) සමථ මණ්ඩල පනත

| | |
|---|---|
| **නිර්දේශිතය** | සමථ මණ්ඩල පනත සඳහා සංශෝධනය. |
| **පසුබිම** | මෙම වර්ගීකරණයන් නිශ්චිතව දැක්වීමේදී එම නඩුකර සමථ කිරීම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රිකාවේ පළකොට නියෝග කරනු ලබනු ඇත. |
| **වත්මන් තත්ත්වය** | සාකච්ඡා වෙමින් පවතියි.<br>අධිකරණ අමාත්‍යාංශය විසින් ඉහත පනත සඳහා අවශ්‍ය සංශෝධන අධ්‍යනය කොට යෝජනා කරන ලෙස ඉල්ලා එවන ලද ලිපිය සභාගත කෙරුණි.<br>කොමිෂන් සභාව විසින් එම කරුණ සම්බන්ධයෙන් අධ්‍යනය කර අදහස් දැක්වීම සඳහා තිසත් විජේගුණවර්ධන මහතා, සභාපති සහ නවීන් මාරපන මහතා යන අයගෙන් සැදුම්ලත් අනුකමිටුවක් පත්කර ගන්නා ලදී. |

## 8.) මහා භාරකාර ආඥාපනත

| | |
|---|---|
| **නිර්දේශිතය** | මහා භාරකාර ආඥාපනත සඳහා වන සංශෝධන. |
| **පසුබිම** | කිසිඳු අයුරකින්වත් සීමා නොකළ මහා භාරකාරත්වයේ බලතලවලට නියම කළ පිරික්සීම්වලට හා තුලනය කිරීමට එම නීති වැදගත් ලෙස සලකන බැවින්, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුකූල කරගත හැකි හා අන්තර්ගත කළ හැකි ව්‍යවස්ථාපිත විධිවිධාන යෝජනා කිරීම සඳහාය. |
| **වත්මන් තත්ත්වය** | සාකච්ඡා වෙමින් පවතියි.<br>ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාව සභාගත කර සාකච්ඡා කරන ලදී.<br>සිංගප්පූරු දේශීය නීතිය සැසඳීමෙන්, විශේෂයෙන්ම පහත දෑ පිළිබඳව, ඔහු විසින් ධනාත්මක ලක්ෂණ විග්‍රහ කරන ලදී.<br>• ආයෝජන මණ්ඩලය සහ මහා භාරකාරත්වය සමග පවතින සංගාමී ක්‍රියාවලිය.<br>• පොදු අරමුදලක සැදුම.<br>• අතෘප්ත පාර්ශව විසින් යොමු කරනු ලබන මහජන පෙත්සම්.<br>• වත්කම්වල නිවැරදි භාණ්ඩ නාමාවලිය.<br>ශ්‍රී ලංකාවේ මහා භාරකාරත්වයේ යුතුකම් හා අරමුණු පිළිබඳව වැඩිදුර අධ්‍යනය කිරීමට කොමිෂන් සභාව එකඟ වූ අතර දේශීය නීතියට ඉහත දැක්වූ ලක්ෂණ අන්තර්ගත කිරීමටත් යෝජනා කරන ලදී. |

9.) වාණිජ මහාධිකරණයේ අධිකරණ බලය

| නිර්දේශිතය | වාණිජ මහාධිකරණයේ අධිකරණ බලය. |
|---|---|
| පසුබිම | වාණිජ නඩුකර සඳහා දැනට පවතින රු.මි.5ක මූල්‍යමය අගය රු.මි.25ක් දක්වා සංශෝධනය කර ගැනීමට යෝජනා කරන ලදී. |
| වත්මන් තත්ත්වය | 2018.09.27 දිනැති හා LC/R/03/2018 අංක දරන ලිපිය මගින් නීති කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඉහත යෝජනාව පිළිබඳ නිල මට්ටමින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කරන ලදී. |

10.) අත්අඩංගුවට ගැනීමේ සහ රිමාන්ඩ් කිරීමේ නීතිය සඳහා සංශෝධන.

| නිර්දේශිතය | අත්අඩංගුවට ගැනීමේ සහ රිමාන්ඩ් කිරීමේ නීතිය සඳහා සංශෝධනය. |
|---|---|
| පසුබිම | පොලිස් නිලධාරීන් සතු අත්අඩංගුවට ගැනීමේ ව්‍යවස්ථාපිත බලය සම්බන්ධයෙන් වන චර්යාවන් සංග්‍රහය ප්‍රතිශෝධනය කිරීම. |
| වත්මන් තත්ත්වය | සාකච්ඡා වෙමින් පවතියි. |

<u>කාලසීමාව :- **2018.10.01 – 2018.12.31**</u>

***2018.10.01 – 2018.12.31 දක්වා නීති කොමිෂන් සභා රැස්වීම් කැඳවා නොමැත. එමනිසා නෛතික කරුණු සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා සිදුකොට නොමැත.**

## 6. 2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන | මු.රෙ.66 යටතේ මාරු කිරීම් | 2018 වර්ෂය සඳහා මුළු ශුද්ධ වෙන්කිරීම් | 2018/12/31 දිනට වියදම | 2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 19,520,000.00 | (175,000.00) | 19,345,000.00 | 13,172,587.81 | 68% |
| ප්‍රාග්ධන වියදම් | 1,950,000.00 | 175,000.00 | 2,125,000.00 | 1,785,957.24 | 84% |
| එකතුව | **21,470,000.00** | - | **21,470,000.00** | **14,958,545.05** | 70% |

## 7. මූල්‍ය කාර්යසාධනය (පුනරාවර්තන වියදම්) 2018/01/01 – 2018/12/31 දක්වා

| | වැය විස්තර | 2018 අයවැය ඇස්තමේන්තුව රු. | මු.රෙ 66 යටතේ මාරු කිරීම් | 2018 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2018/01/01 සිට 2018/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 | වැටුප් හා වේතන | 7,500,000.00 | - | 7,500,000.00 | 5,509,249.88 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 200,000.00 | - | 200,000.00 | 196,112.46 |
| 1003 | වෙනත් දීමනා | 6,500,000.00 | - | 6,500,000.00 | 3,388,027.90 |
| | **ගමන් වියදම්** | | | | |
| 1101 | දේශීය | 25,000.00 | - | 25,000.00 | 13,480.00 |
| 1102 | විදේශීය | 1,000,000.00 | (500,000.00) | 500,000.00 | 58,442.90 |
| | **සැපයීම** | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 450,000.00 | - | 450,000.00 | 422,079.13 |
| 1202 | ඉන්ධන | 450,000.00 | (50,000.00) | 400,000.00 | 399,211.74 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 200,000.00 | (50,000.00) | 150,000.00 | 129,290.00 |
| | **නඩත්තු වියදම්** | | | | |
| 1301 | වාහන | 550,000.00 | - | 550,000.00 | 549,537.02 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 350,000.00 | (200,000.00) | 150,000.00 | 84,458.16 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000.00 | (80,000.00) | 20,000.00 | 8,495.00 |
| | **සේවා** | | | | |
| 1402 | තැපැල් සහ සන්නිවේදනය | 500,000.00 | (100,000.00) | 400,000.00 | 316,946.38 |
| 1403 | විදුලිය සහ ජලය | 1,100,000.00 | 900,000.00 | 2,000,000.00 | 1,632,500.09 |
| 1409 | වෙනත් | 400,000.00 | - | 400,000.00 | 379,759.21 |
| | **මාරු කිරීම්** | | | | |
| 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 15,000.00 | (15,000.00) | - | - |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 180,000.00 | (80,000.00) | 100,000.00 | 84,997.94 |
| | එකතුව | **19,520,000.00** | **(175,000.00)** | **19,345,000.00** | **13,172,587.81** |

## 8. මූල්‍ය කාර්යසාධනය (ප්‍රාග්ධන වියදම්) 2018/01/01 – 2018/12/31 දක්වා

| වැය විෂය | වැය විස්තරය | 2018 සඳහා මුළු අයවැය ඇස්තමේන්තුව රු. | මු.රෙ 66 යටතේ මාරු කිරීම් | 2018 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2018/01/01 සිට 2018/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 20,000.00 | - | 20,000.00 | - |
| 2003 | වාහන | 250,000.00 | 250,000.00 | 500,000.00 | 459,540.11 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | | | | |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 400,000.00 | 525,000.00 | 925,000.00 | 894,617.13 |
| | ශක්‍යතා වර්ධනය | | | | |
| 2401 | පුහුණු සහ ශක්‍යතා වර්ධනය | 1,280,000.00 | (600,000.00) | 680,000.00 | 431,800.00 |
| | එකතුව | **1,950,000.00** | **175,000.00** | **2,125,000.00** | **1,785,957.24** |

## 9. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී " ගිණුම - 2018 දෙසැම්බර් 31 දිනට

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයන්ගේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් : | 1,300,000.00 | 400,000.00 | 3,600,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධන සීමාවන් :* | - | - | - |
| වර්ෂය අවසානයේ සත්‍ය අගයන් : | 1,282,850.00 | 1,797,226.00 | 2,139,312.62 |

### අත්තිකාරම් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2018

| | දෙපාර්තමේන්තු පොත් අනුව | භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ ශේෂය (2018.01.01 දිනට) | 2,478,258.62 | 2,478,258.62 |
| එකතු කළා : වර්ෂය තුළ මුළු හර කිරීම් | 1,458,280.00 | 1,458,280.00 |
| අඩුකළා : වර්ෂය තුළ මුළු බැර කිරීම් | 1,797,226.00 | 1,797,226.00 |
| වර්ෂය අවසානයේ ශේෂය (2018.12.31 දිනට) | **2,139,312.62** | **2,139,312.62** |

## 10. 2018.12.31 වන දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සහ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩල සංයුතිය

| තනතුර | ශ්‍රේණිය | වැටුප් තලය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| ලේකම් | I | SL-1-2016 | 1 | - | | | 1 |
| නියෝජ්‍ය ලේකම් | II | SL-1-2016 | 1 | - | | | 1 |
| සහකාර ලේකම් | III | SL-1-2016 | 4 | 3 | | | 1 |
| භාෂා පරිවර්තක | II/ I | MN-6-2016 | 1 | 1 | | | - |
| ගිණුම් සහකාර නිලධාරී | III/ II/ I | MN-4-2016 | 1 | - | | | 1 |
| සංවර්ධන නිලධාරී | III/ II/ I | MN-4-2016 | 4 | 1 | | | 3 |
| පුස්තකාලයාධිපති | III/ II/ I | MN-3-2016 | 1 | 1 | | | - |
| කළමනාකරණ සහකාර නිලධාරී | III/ II/ I | MN-2-2016 | 8 | 4 | | | 4 |
| ලඝුලේඛිකා | III/ II/ I | MN-1-2016 | 1 | - | | | 1 |
| රියදුරු | III/ II/ I | PL-3-2016 | 4 | 4 | | | - |
| කා.කා.ස. | III/ II/ I | PL-1-2016 | 3 | 2 | | | 1 |
| එකතුව | | | **29** | **16** | | | **13** |